තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
தகவல் தொழிநுட்ப முகாமைத்துவ திணைக்களம்
Department of Information Technology Management

ITMD
ENRICHING DIGITAL ECONOMY

කාර්යසාධන වාර්තාව
செயலாற்றுத்திறன் அறிக்கை
Performance Report

2025

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

කාර්යසාධන වාර්තාව
2025

ENRICHING DIGITAL ECONOMY

©2026තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

මහලේකම් කාර්යාලය
කොළඹ 01
ශ්‍රී ලංකාව

info@itmd.treasury.gov.lk
https://itmd.treasury.gov.lk

Website facebook Whatsapp Channel YouTube LinkedIn

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
ශීර්ෂ අංකය - 329

01 **01 පරිච්ඡේදය**
ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 **02 පරිච්ඡේදය**
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 **03 පරිච්ඡේදය**
වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

04 **04 පරිච්ඡේදය**
කාර්යසාධන දර්ශක

05 **05 පරිච්ඡේදය**
තිරසර සංවර්ධන අරමුණු **(SDG)**
සපුරා ගැනීමේ කාර්යසාධනය

06 **06 පරිච්ඡේදය**
මානව සම්පත් පැතිකඩ

07 **07 පරිච්ඡේදය**
අනුකූලතා වාර්තාව



Public

Abbrivations

AD	- Active Directory
AD	- Assistant Director
ADG	- Additional Director General
AI	- Artifical Intelligence
AO	- Administrative Officer
CII	- Critical Information Infrastructure
COPA	- Committee on Public Accounts
DD	- Deputy Director
DMA	- Department of Managemnt Audit
DO	- Development Officer
DPI	- Digital Public Infrastruture
GFLSM	- Guarantee Fund Loan Settlement Monitoring Systems
ICT	- Information & Communication Technology
ICTA	- Information and Communication Technology Assistant
ICTO	- Information and Communication Technology Officer
IP/VPN	- Internet Protocol/ Vertual Private Network
IT	- Information Technology
ITMD	- Department of Information Technology Management
L3	- Layer 3
LGC	- Lanka Government Cloud
MoF	- Ministry of Finance
MSO	- Management Servicers Officer
NBD	- Department of National Budget
NCSOC	- National Cyber security Operation center
NFAMS	- Non-Financial Assets Management System
NIC	- National Identity Card
NOC	- Network Operation Center
NPD	- Department of National Planning
OES	- Office Employee Service
OLMS	- Overseas Leave Management System
PC	- Personnel Computer
PP&E	- Property, Plant and Equipment
UAT	- User acceptance Testing
VLAN	- Vertual Local Area Network
VM	- Virtual Machine

01 පරිච්ඡේදය
ආයතන පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව ප්‍රධාන උපායමාර්ගික ක්ෂේත්‍ර පහක් කෙරෙහි අවධානය යොමු කරමින් ශක්තිමත් ඩිජිටල් ආර්ථිකයක් සංවර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇත:

- ➢ විනිවිද සහ කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් සහතික කිරීම
- ➢ තරඟකාරී ලෙස ඩිජිටල් කර්මාන්තය සංවර්ධනය කිරීම
- ➢ සමස්ත ඩිජිටල් ආර්ථිකය මෙහෙයවීම
- ➢ උපායමාර්ගික කර්මාන්තවල ඩිජිටල් පරිවර්තනය සක්‍රිය කිරීම
- ➢ කර්මාන්ත, රජය සහ පුරවැසියන් හරහා ධාරිතා සංවර්ධනය ශක්තිමත් කිරීම

මෙම දැක්මට සමගාමීව, ඩිජිටල් ආර්ථික සැලැස්ම (Digital Economy Blueprint) මගින් සියල්ලන් ඇතුළත්ව ආර්ථික වර්ධනය වේගවත් කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ පුරවැසි යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා පුළුල් මාර්ග සිතියමක් දක්වා ඇත. විශ්වීය ඩිජිටල් සම්බන්ධතාව, ශක්තිමත් පොදු ඩිජිටල් යටිතල පහසුකම්, උසස් ඩිජිටල් වේදිකා සියල්ල ඇතුළත් ප්‍රතිපත්ති රාමු සහ ඉලක්කගත රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන හරහා මෙය සාක්ෂාත් කරගනු ඇත.

මෙම මහ පෙන්වීමට සමගාමීව, 2025 වර්ෂයේදී, "ඩිජිටල් ආර්ථිකය සවිබලගැන්වීම" යන තේමාව යටතේ, මුදල් අමාත්‍යාංශය සමෘද්ධිමත් ඩිජිටල් ආර්ථිකයක් දෙසට ගමන් කිරීමේ ගමන් මාර්ගයට උපකාරී වන පියවර කිහිපයක් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (ITMD) විසින් ගෙන ඇත.

- මෙහෙයුම් අඛණ්ඩතාව සහ පද්ධති වල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සහතික කරමින් මුදල් අමාත්‍යාංශයේ සියලු දෙපාර්තමේන්තු සඳහා පුළුල් තොරතුරු තාක්‍ෂණ සේවාවක් ලබා දීම
- ආරක්ෂිත ජාල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම හා අවහිරතාවලින් තොර සන්නිවේදනය සක්‍රිය කිරීම තුලින් අනාගත ඩිජිටල් පරිවර්තනයකට මුලපිරීම පිණිස ශක්තිමත් පදනමක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශයේ ජාල යටිතල පහසුකම් ශක්තිමත් කිරීම
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සහ මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ඉතා වැදගත් හා අත්‍යාවශ්‍ය ජාල උපකරණ සහ උපස්ථ පද්ධති සඳහා වැඩිදියුණු කළ ආරක්‍ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම
- මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු කිහිපයක් සඳහා පද්ධති සංවර්ධනය ඇතුළුව, මුදල් අමාත්‍යාංශයට අයත් ආයතනවල ඇතැම් ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම මගින් අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දෙන සේවාවන්හි විනිවිදභාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම
- අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින් පද්ධති සංවර්ධනය, ඒකාබද්ධ කිරීම සහ දත්ත හුවමාරු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම

1.2. ආයතනයේ දැක්ම. මෙහෙවර, අරමුණු

දැක්ම

රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ඩිජිටල්කරණය කළ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.

මෙහෙවර

භාණ්ඩාගාර කටයුතු නිසි කලට වේලාවට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම පිණිස තීරණ ගැනීමට සහය වීම උදෙසා භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණයට අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

අරමුණු

- ඉ-රාජ්‍ය සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- කඩදාසි භාවිතයෙන් තොර කාර්යාල පරිසරයක් නිර්මාණය සඳහා ඵලදායි ඩිජිටල් සන්නිවේදන ප්‍රවේශයකට අවතීර්ණ වීම
- කාර්යක්ෂම සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා පද්ධති සංවර්ධනය කිරීම
- මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් බාධාවකින් තොරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ලබා දීම සහතික කිරීම වෙනුවෙන් මූලික යටිතල පහසුකම් නවීකරණය කිරීම
- අමාත්‍යාංශයේ වෙබ් ද්වාරය සහ වෙනත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රම හරහා පුරවැසියන්ට අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සහතික කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- විවිධ ආයතනවල ඩිජිටල්කරණ වැඩසටහන් සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් සහය වීම
- මුදල් අමාත්‍යාංශයට සහ එහි දෙපාර්තමේන්තු සඳහා සම්මත තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ක්‍රියාවලිවල නිසි ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා තොරතුරු තාක්‍ෂණ පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම
- ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මුලපිරීම් සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම සහ ව්‍යාපෘති ජීවන චක්‍රය පුරාවට අවශ්‍ය පහසුකම් සැලසීම
- භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සඳහා සයිබර් ආරක්ෂාව තහවුරු කිරීම සඳහා, අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් පහසුකම් සැලසීම
- භාණ්ඩාගාර වෙබ් අඩවිය මඟින් යාවත්කාලීන තොරතුරු සැපයීම
- නියමිත කාලවලදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික පුහුණු අවස්ථා ලබා දීම

1.4. සංවිධාන සටහන



ADG අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
DD නියෝජ්‍ය අධ්‍යක්ෂ
AD සහකාර අධ්‍යක්ෂ
AO පරිපාලන නිලධාරි
ICTO තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි

DO සංවර්ධන නිලධාරි
ICTA තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
MSO කළමනාකරණ සේවා නිලධාරී
OES කාර්යාල සේවක සේවය

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/අරමුදල් - නැත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්) – අදාල නැත

02 පරිච්ඡේදය
ප්‍රගතිය සහ අනාගත දැක්ම

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය/මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කරන අතරම, ආර්ථික ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී රජයට සහය වීම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ ඩිජිටල් පරිවර්තනය සම්බන්ධීකරණයට පහසුකම් සැපයීම පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

2.1 2025 වර්ෂයේදී ලබාගත් විශේෂ ජයග්‍රහණ

2.1.1 ප්‍රතිපත්ති හා සංවර්ධන

❖ රජයේ ආදායම් එකතු කිරීමට සම්බන්ධ තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීම

රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුව, රජයේ ආදායම් එකතු කිරීමට සම්බන්ධ ප්‍රධාන ආයතන 13 ක තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ ඒකාබද්ධ කිරීම තුළින් රජයේ ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ අරමුණින්, තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීමේ ශක්‍යතාව පරීක්ෂා කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්බන්ධ විය

මෙම දෙපාර්තමේන්තුව, උක්ත පද්ධති ඒකාබද්ධ කිරීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය අඛණ්ඩව සිදු කළ අතර එකී ආයතන 13 හි පද්ධති ඒකාබද්ධ කිරීමේ මූලපිරීම්වල ප්‍රගතිය අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා වූ ප්‍රගති සමාලෝචනය, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, තාක්ෂණික කමිටුවල සාමාජිකයින් සහ අදාළ සම්බන්ධීකරණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026 ජනවාරි මාසයේදී පැවැත්විණි.

❖ භාණ්ඩාගාර තොරතුරු පද්ධති විශ්ලේෂණය හා ඩිජිටල්කරණය වේගවත් කිරීම

2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 36 වන වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාරයේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ඵලදායී පරිගණක පද්ධතියක් සංවර්ධනය කළ යුතුය. අසාර්ථක අවස්ථාවන්හිදී පවා ගනුදෙනු විශ්වසනීයත්වය, දත්ත අඛණ්ඩතාව සහ නිරවද්‍යතාවය සහතික කරන දත්ත සමුදා සහතික හතරක කට්ටලයක් වන පරමාණුකතාව, අනුකූලතාව, හුදකලාව සහ කල්පැවැත්ම යන ACID ගුණාංගද සැළකිල්ලට ගනිමින්, දත්ත පරතර විශ්ලේෂණය සහ මහා භාණ්ඩාගාරයේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම සඳහා මූලපිරීමක් ලෙස භාණ්ඩාගාර දෙපාර්තමේන්තු 16 ක තොරතුරු පද්ධති පිළිබඳ විස්තර ලබා ගන්නා ලදී.

❖ දෙපාර්තමේන්තුවට අදාළව රෙගුලාසි, නියෝග, හා ක්‍රියාකාරී සැලැස්ම

2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 36 වැනි වගන්තිය ප්‍රකාරව, තොරතුරු තාක්ෂණ පද්ධති ක්‍රමානුකූලව, සුරක්ෂිතව හා විනිවිදභාවයෙන් යුතුව සැලසුම් කිරීමට අදාළ රෙගුලාසි, නියෝග සහ ඉදිරි අවුරුදු පහ සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

❖ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති

කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති මාලාවක් හරහා මහා භාණ්ඩාගාරයේ ඩිජිටල්කරණ ගමන ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති 13 ක් අධ්‍යයනය කිරීම සහ කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදී.

❖ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

ගෝලීය ICT කර්මාන්තය නියෝජනය කරන ICT ප්‍රමුඛයන් සමඟ ඉහළ මට්ටමේ සාකච්ඡා 20 කට වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී. මෙම සාකච්ඡා මගින් රාජ්‍ය අංශයට අවශ්‍ය යාවත්කාලීන දැනුම අවශෝෂණය කර ගැනීමට සහ කර්මාන්තයේ තරඟකාරී ප්‍රවණතා සමඟ පෙළගැසීමට අවස්ථා සැලසුණි.

2.1.2 පද්ධති සංවර්ධනය

භාණ්ඩාගාරයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය වර්ධනය කිරීම අරමුණු කරගනිමින්, ITMD මෘදුකාංග සංවර්ධන කණ්ඩායම විසින් ප්‍රධාන ඩිජිටල් විසඳුම් දෙකක් සාර්ථකව සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද අතර GFLSMS පද්ධතිය නිල වශයෙන් දියත් කරන ලදී.

❖ Guarantee Fund Loan Settlement Monitoring System (GFLSMS) පද්ධතිය නිල වශයෙන් දියත් කිරීම



භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ණය පියවීම් අධීක්ෂණ ක්‍රියාවලිය බාධාවකින් තොර, කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුක්ත ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, ඇපකර අරමුදලින් ණය නිරවුල් කිරීම් අධික්ෂණ පද්ධතිය (GFLSMS) 2025 ජනවාරි 06 වන දින නිල වශයෙන් දියත් කරන ලදී.

❖ Overseas Leave Management System (OLMS)

භාණ්ඩාගාර ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි විදේශ නිවාඩු කළමනාකරණ පද්ධතිය (OLMS) සංවර්ධනය කර 2025 සැප්තැම්බර් 18 වන දින සාර්ථකව දියත් කරන ලදී. මෙමගින් විදේශ නිවාඩු අනුමත කිරීමේ ක්‍රියාවලියේ පවතින ප්‍රමාදයන් සහ නිලධාරීන්ගේ පෙර විදේශ නිවාඩු පිළිබඳ තොරතුරු එක් පද්ධතියක් තුළින් දැකගත නොහැකි වීම විසඳීම අරමුණ විය. මෙම පද්ධතිය මඟින් විදේශ නිවාඩු අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කර වාර්තා වල විනිවිදභාවය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

❖ Audit Management System (Xpert Audit) – Audit Plan Creation Module

2024 වර්ෂයේදී ආරම්භ කර, පසුව DMA Connect ලෙස නැවත නම් කරන ලද Xpert Audit පද්ධතියට අයත් විගණන සැලැස්ම සකස් කිරීමේ මොඩියුලයේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (User Acceptance Testing – UAT) සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී.

2.1.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහාය සහ මුලපිරීම්

❖ ප්‍රශස්ථ කාර්යසාධනය සඳහා පුළුල් පරිගණක සංගණනය

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයේ ඇති සියලුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි පරිගණක සංගණනයක් සාර්ථකව සිදු කරන ලදි. මෙම සමීක්ෂණය තුළදී මෙහෙයුම් පද්ධති, ප්‍රති වෛරස් ආරක්ෂණ පද්ධති වැනි තීරණාත්මක තාක්ෂණික දත්ත ග්‍රහණය කර ගනිමින් සාම්ප්‍රදායික ඩෙස්ක්ටොප් පරිගණක, AIO ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් ඇතුළු සියලුම පරිගණක වත්කම් ක්‍රමානුකූලව ලේඛනගත කිරීම සිදුකරන ලදි. මෙම පුළුල් සමීක්ෂණය මඟින් අමාත්‍යාංශයේ වත්මන් තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමට හැකි වූ අතර, දෘඩාංග නඩත්තු කාල සටහන් නිසි පරිදි සකස්කිරීම, පද්ධති යාවත්කාලීන කිරීම් සිදුකිරීම, ප්‍රති-වයිරස් කළමනාකරණය සහ දෙපාර්තමේන්තු අතර ප්‍රශස්ත අයුරින් තාක්ෂණික වත්කම් බොදාහැරීම පිළිබඳව මූලික තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසින. සමීක්ෂණ දත්ත මඟින් තාක්ෂණ හිඩැස්, ආරක්ෂක දුර්වලතා සහ තාක්ෂණ උපකරණවල ආයු කාලය වැනි කරුණු පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි වූ අතර ක්‍රියාශීලී තාක්ෂණ වත්කම් කළමනාකරණය සහ අයවැය සැලසුම්කරණය සඳහා ද මනා පිටිවහලක් විය.

මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු වල ඇති පරිගණක පිළිබඳ සාරාංශයක් පහත ඉදිරිපත් කර ඇති අතර, එමගින් පරිගණක සම්පත් බෙදී ඇති ආකාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දී ඇත.



❖ සුමට මෙහෙයුම් ක්‍රියාවලියක් සඳහා දෘඩාංග ගැටළු විසඳීම

යථොක්ත කාලය තුළ, මුදල් අමාත්‍යාංශයේ සියලු දෙපාර්තමේන්තු ආවරණය කරමින් පුළුල් තොරතුරු තාක්ෂණ සහාය සේවාවක් සැපයීමේ ක්‍රියාවලියේදී මෙහෙයුම් අඛණ්ඩතාවය සහ පද්ධති අඛණ්ඩතාවය සහතික කරමින් ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. පරිගණක අක්‍රියතාවයන්, මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම්, ස්කැනර් සහ ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාවන්, පසු ප්‍රක්ෂේපන යන්ත්‍රවල දෝෂ නිරාකරණය, ජාල සම්බන්ධතා ගැටළු, විද්‍යුත් තැපැල් ගිණුම් වලට ප්‍රවේශ වීමේ ගැටළු, පරිගණක යෙදවුම් මෘදුකාංග සඳහා ලබා දෙන සහාය ඇතුළු පුළුල් පරාසයක තාක්ෂණික ගැටළු සාර්ථකව විසඳීමට හැකි විය. මීට අමතරව පරිශීලක පිවිසුම් කළමනාකරණය, මුරපද ප්‍රතිස්ථාපනය, දත්ත උපස්ථ කටයුතු, ආරක්ෂණ යාවත්කාලීන කිරීම් සහ ප්‍රති වෛරස් ආරක්ෂක පද්ධති වැනි තීරණාත්මක පරිපාලන සහ ආරක්ෂක කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කරන ලදි.

කාර්යසාධන දත්ත වලට අනුව, විසඳන ලද ගැටළු ප්‍රධාන වශයෙන් මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, ඡායා පිටපත් යන්ත්‍ර සහ පසු ප්‍රක්ෂේපන යන්ත්‍ර ආශ්‍රිත ගැටළු සහ පරිගණක හා දෘඩාංග අලුත්වැඩියා කටයුතු වශයෙන් මූලික කාණ්ඩ දෙකක් යටතේ කේන්ද්‍ර ගත වී ඇති අතර, මෙම දත්ත, වසර තුල උපාය මාර්ගිකව සම්පත් ප්‍රතිපාදන ක්‍රියාවලිය සඳහා මහඟු ලෙස උපකාරී විය. තාක්ෂණික දෝෂ කඩිනමින් හඳුනාගනිමින් ඒවාට සාර්ථක විසඳුම් ලබා දීම මගින්, පද්ධතිවල අක්‍රිය කාලය (downtime) සැලකිය යුතු ලෙස අඩු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වූ අතර එමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අමාත්‍යාංශයේ මූල්‍ය ක්‍රියාවලියන් බාධාවකින් තොරව පවත්වාගෙන යෑම, අන්තර් දෙපාර්තමේන්තු සන්නිවේදනය සහ තීරණාත්මක මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව සිදු කිරීම සහතික කර ඇත. 2025 ජනවාරි මස සිට 2025 දෙසැම්බර් මස දක්වා සියලු සේවා කාණ්ඩ යටතේ විසඳන ලද ගැටළු වල ව්‍යාප්තිය පහත ප්‍රස්ථාරය මගින් පැහැදිලි කර ඇත.



මූලාශ්‍රය: ITMD උපකාරක සේවා තොරතුරු

❖ ජාල යටිතල පහසුකම් නවීකරණය

2025 වසර තුල පුළුල් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ඔස්සේ පිරිනමන ලද ටෙන්ඩර් පටිපාටියකින් අනතුරුව අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපිත කර තිබූ පැරණි ජාල ස්විචයන් (floor switches) 15ක් ඉවත් කර, ඒ වෙනුවට උසස් තාක්ෂණයෙන් යුත් (L3) ජාල ස්විචයන් ස්ථාපනය කරමින් ප්‍රධාන යාවත්කාලීන කිරීමක් සිදු කරන ලදී. මෙම නවීකරණ ක්‍රියාවලිය හේතුවෙන් පරිගණක ජාලයේ වේගවත් බව, ජාල ගමනාගමන කළමනාකරණය සහ අන්තර්-VLAN මාර්ගගත කිරීමේ හැකියාවන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවිණි. මීට අමතරව, මුදල් අමාත්‍යාංශයේ IPVPN ජාල ස්විචයන් දෙකක් උපායමාර්ගිකව ස්ථාපනය කිරීම මගින් බාහිර ජාල සමඟ පවතින සන්නිවේදනය වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම විය. මෙම වැඩිදියුණු කිරීම් මගින් ඉහළ ජාල ආරක්ෂාවක්, අවම ප්‍රමාද කාලයක් සහ අනාගත ඩිජිටල් පරිවර්තන මුලපිරීම් සඳහා ශක්තිමත් පදනමක් අමාත්‍යාංශය තුල ඇති කරන ලදී

❖ ආරක්ෂාව ඉහළ නැංවීම: තීරණාත්මක යටිතල පහසුකම් අධීක්ෂණය

භෞතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ තීරණාත්මක තොරතුරු තාක්ෂණ වත්කම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ සහ UPS මැදිරිය තුළ CCTV නිරීක්ෂණ පද්ධති ස්ථාපනය කරන ලදී. මෙම ආරක්ෂක වැඩිදියුණු කිරීම මගින් මෙම පරිශ්‍රයන් වලට සිදුවන සියලු ප්‍රවේශයන් සහ ක්‍රියාකාරකම් තත්‍ය කාලීනව නිරීක්ෂණය කිරීමට මෙන්ම පටිගත කිරීමටද හැකියාව ලබා දෙන අතර වගවීම සහතික කිරීම, අනවසර ප්‍රවේශයන් වැළැක්වීම සහ සිදුවීම් වලදී වේගවත්ව ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සපයයි.මෙම ස්ථාපනය මඟින් මෙහෙවර-තීරණාත්මක ජාල උපකරණ සහ බල උපස්ථ පද්ධති සඳහා අමතර ආරක්ෂාවක් සපයන අතර එමඟින් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල මෙහෙයුම් අඛණ්ඩතාවය සහතික කර ඇත.

2.1.4 ධාරිතා සංවර්ධනය – Friday Forum

මෙම දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාර නිලධාරින්ගේ තාක්ෂණික දැනුම සහ ප්‍රායෝගික භාවිතය වැඩිදියුණු කිරීම පෙරදැරිව 2024 දී ආරම්භ කරන ලද Friday Forum වැඩසටහන 2025 වසර තුල ඉලක්කගත මට්ටම අභිබවමින් සාර්ථකත්වය කරා ලඟාවීමට හැකි විය. මෙකී සාර්ථකත්වය සඳහා බලපෑ ප්‍රධානතම හේතු සාධකය වූයේ කාලානුරූප මාතෘකා මෙන්ම ප්‍රවීණත්වයෙන් හෙබි සම්පත්දායකයින්ගේ සහයෝගය ලබා ගැනීමත්, එම වැඩසටහන්, “ITMD Techo” YouTube නාලිකාව තුලින් පරිශීලකයන් විශාල ප්‍රමාණයක් වෙත නැරඹිය හැකි ලෙසින් ප්‍රචාරය කිරීමයි. එසේම අදාල වැඩසටහන් තෝරා ගැනීමේදී නිලධාරීන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒ තුල පවත්නා ප්‍රායෝගිකත්වය මත මෙම වැඩසටහන් රාජ්‍ය නිලධාරීන් අතර වඩාත් ජනප්‍රියත්වයට පත්විය.

“ITMD Techo” YouTube නාලිකාව මෙතෙක් ලද ප්‍රගතිය පහත දත්ත විශ්ලේෂණය මඟින් මනාව පිළිඹිබු වේ.





Introduction to the Resilient DC White Paper
Questions
&
Answers
WAYS TO
ITMD
ENRICHING DIGITAL ECONOMY
FRIDAY
FORUM

2025 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්:

අංකය	වැඩසටහනේ නම	සහභාගී වූ නිලධාරීන් ගණන
01	IT Projects in Sri Lanka	135
02	Digital Public Infrastructure (DPI) and Its Role in Modern Governance	59
03	Recent Trends in IT Sector Development with a focus on India's Experience	29
04	Cybersecurity Awareness & Best Practices	114
05	Unlock the Power of M365: Boost Productivity & Collaboration	51
06	Shield Your Digital World: Unified Defence On a Single Pane of Glass	83
07	Empowering Government Through Digital Transformation:Secure, Scalable and Smart Solutions	89
08	Protecting the Digital Estate using the World's most Advanced AI/ML – based Cybersec Technologies	64
09	The End-To-End Data Journey	94
10	Towards a Citizen-centric Government in the Era of Agentic AI	35
11	Shifting the Balance Secure-By-Design Strategies in Public Sector IT Procurement	150
12	Building a Resilient Data Center – The Strategic Imperative of Resilient Data Centers in the AI Era	142
13	AI Tools	30
14	e-Payroll Review Session	29
15	Basic Concepts of Graphic Designing	34
16	Designing Tools Adobe Photoshop – Part 01	38
17	Procurement of Information Systems	155
18	Guarantee Fund Loan Settlement Monitoring System	32
19	BID Evaluation	221
20	Tansforming Public Project Delivery in Sri Lanka for Economic Recovery	284
21	AI Powered Productivity – Simple Ways to Transform Daily Office Tasks Easier	685
22	Scroll Smart: Staying Safe on Social Media and Massaging Apps	121

❖ වෙනත් රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධන වැඩසටහනක් ලෙස, "Friday Forum" ආරම්භ කරන ලද අතර එය අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සිටින නිලධාරීන්ගේ දැනුම හා නිපුණතා වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන රාජ්‍ය ආයතන අතර ව්‍යාප්ත කරන ලදී. මෙම වැඩසටහන් අදාල ආයතනයන්ගේ ඉල්ලීම් පදනම් කරගනිමින් පවත්වනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් බැහැරව පවත්වන ලද ප්‍රථම වැඩසටහන කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලද අතර එය බොහෝ පිරිසකට නැරඹිය හැකි ලෙසින් සජීවීව "ITMD Techo" Youtube නාලිකාව මඟින් ප්‍රචාරය කරන ලදි. මෙය අන්තර් ආයතනික සහයෝගීතාව ශක්තිමත් කිරීමට සහ දෙපාර්තමේන්තුවේ දැනුම බෙදා ගැනීමේ උත්සාහයන් පුළුල් කිරීමට මහඟු පිටුවහලක් විය.

2.2 අනාගත ක්‍රියාකාරකම්

මුදල් අමාත්‍යාංශය තුළ ප්‍රශස්ථ ඩිජිටල් වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා අනාගතයේදී පහත කාර්යයන් සිදු කිරීමට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇත.

❖ **ආන්තික පරිශීලක උපාංග නවීකරණය**

නවීන යෙදවුම් සහ ආරක්ෂක ප්‍රමිතීන් සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව භාණ්ඩාගාරයේ සහ එහි දෙපාර්තමේන්තුවල යල් පැන ගිය පරිගණක සහ ලැප්ටොප් 1,000 කට ආසන්න ප්‍රමාණයක් ඉවත් කර නවීන පරිගණක ප්‍රතිස්ථාපනය කිරීමට මුදල් අමාත්‍යාංශය සැලසුම් කර ඇත. ප්‍රමිතිගත මෙහෙයුම් පද්ධති ස්ථාපනය කිරීම, අවශ්‍ය ඵලදායිතා සහ ව්‍යාපාර රේඛීය මෘදුකාංග ස්ථාපනය කිරීම, ක්‍රියාකාරී නාමාවලිය (Active Directory) සමඟ ජාලගත කිරීම, පරිශීලක තොරතුරු වින්‍යාසකරණය සහ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය බලාත්මක කිරීම මෙම ක්‍රියාකාරකමට ඇතුළත් වේ. මෙම නවීකරණ කටයුතු මඟින් පද්ධතිවල විශ්වසනීයත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීම, දෘඩාංග දෝෂ අවම කිරීම, පරිශීලක ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් සහ දෛනික පරිපාලන කටයුතු සඳහා අඛණ්ඩව සහාය සැලසීම සහතික කරනු ලබයි.

❖ **පර්යන්ත සහ සේවාදායක උපාංගවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම**

සමස්ත සයිබර් ආරක්ෂණ තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා, මුදල් අමාත්‍යාංශය සහ එහි දෙපාර්තමේන්තුවල උසස් තත්ත්වයේ පර්යන්ත සහ සේවාදායක ආරක්ෂක විසඳුම් ක්‍රියාත්මක කෙරේ. මෙයට තත්‍ය කාලීන තර්ජන හඳුනාගැනීම, හානිදායි මෘදුකාංග වලින් ආරක්ෂාවීම සහ ප්‍රතිපත්ති මත පදනම් වූ ආරක්ෂක පාලනයන් සහිත මධ්‍යගත ප්‍රති-වයිරස පද්ධතියක් හා ආරක්ෂණ ක්‍රමවේදයක් යෙදවීමද ඇතුළත් වේ. මෙම විසඳුම භාණ්ඩාගාර පරිගණක, ලැප්ටොප් සහ තීරණාත්මක සර්වර් පරිගණකයන් ආවරණය කරනු ඇති අතර, මධ්‍යගත අධීක්ෂණය, සිද්ධීන් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ජාතික තොරතුරු ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වීමද සහතික කරනු ලබයි. මෙමඟින් සයිබර් තර්ජන, දත්ත පද්ධති බිඳවැටීම් හා රහසිගත ප්‍රවේශ වීම් වැනි අවදානම් අඩු කරනු ඇත.

❖ **ජාල යටිතල පහසුකම් නවීකරණය**

පැරණි ජාල යටිතල සේවා උපාංග ඉවත්කර නවීන හා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු උපාංග හා පහසුකම් සහිතව වැඩිදියුණු කෙරේ. මෙමගින් දෙපාර්තමේන්තු අතර ආරක්ෂිත දත්ත සම්ප්‍රේෂණයක් සඳහා පහසුකම් සැලසෙන අතර බෑන්ඩ්විත් ධාරිතා පරාසය හා ජාල ස්ථායිතාවය වැඩිදියුණු වීම මෙන්ම දෝෂ දරාගැනීමද වැඩිදියුණු කරනු ඇත. එමගින් අභ්‍යන්තර පද්ධති, අන්තර්-දෙපාර්තමේන්තු සන්නිවේදනය සහ අනාගත ඩිජිටල් සේවාවන් සඳහා විශ්වාසනීය ජාල සම්බන්ධතාවයක් සහතික කරනු ඇති අතර වැඩිවන මෙහෙයුම් සීඝ්‍රතාවයන් වලට සහාය පිණිස වඩා ප්‍රශස්ථ ජාල කළමනාකරණයක්, අධීක්ෂණයක් සහ පරිමාණ ගත කිරීමේ හැකියාවක් ද ලබා දෙනු ඇත.

❖ **අතථ්‍ය පරිසරය (Virtualization) වැඩිදියුණු කිරීම**

ප්‍රශස්ථ පද්ධති ක්‍රියාකාරිත්වය, අධි-ප්‍රතිගම්‍යතාවය (High Availability) සහ කාර්යක්‍ෂම සම්පත් භාවිතය තහවුරු කරනු පිණිස පවතින අතථ්‍ය යන්ත්‍ර (Virtual Machines) යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ලැබේ. තීරණාත්මක යෙදවුම් මගින් වඩාත් ඵලදායී සත්කාරක සේවාවක් සැපයීම සඳහා හයිපවයිසර, දත්ත ගබඩා සහ අතථ්‍යකරණ කළමනාකරණ මෙවලම් වැඩිදියුණු කිරීම මෙයට ඇතුළත් වේ. මෙම වැඩිදියුණු කළ අතථ්‍යකරණ පරිසරය මගින් පද්ධති අක්‍රීය කාලය අඩු කරන අතර යෙදවුම් ප්‍රතිචාර දැක්වීම වැඩි වීම, ආපදා ප්‍රතිසාධන හැකියාවන්ට සහාය වීම සහ පවතින සහ අනාගත රාජ්‍ය පද්ධතීන් ස්ථාපනය (hosting) කිරීම වැනි කරුණු සඳහා පරිමාණයන් වෙනස් කළ හැකි පදනමක් සපයනු ලබයි.

❖ **රාජ්‍ය මේඝ සේවාවට (LGC) සංක්‍රමණය වීම**

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ප්‍රතිපත්තිවලට අනුකූලව, ආරක්ෂිත හා පරිමාණයන් කළ හැකි මෙන්ම තිරසාර පද්ධතිවල සත්කාරකත්වය සහතික කිරීම සඳහා තෝරාගත් පද්ධතීන් ලංකා රාජ්‍ය මේඝ සේවාවට (LGC) සංක්‍රමණය කෙරේ. මෙම ක්‍රියාවලියේදී පද්ධති තක්සේරුකරණය, සංක්‍රමණ සැලසුම් සකස්කිරීම, දත්ත හුවමාරුව, පරීක්‍ෂාව සහ සංක්‍රමණය කිරීමෙන් පසු ප්‍රශස්තිකරණයද ඇතුළත් වේ. රාජ්‍ය මේඝ සේවාවට සංක්‍රමණය වීම මඟින් දිගුකාලීන යටිතල පහසුකම් සඳහා වැයවන පිරිවැය අඩුවන අතරම පද්ධතිවලට සුලබව පිවිසීමේ හැකියාව, කාර්යක්‍ෂමතාවය සහ ආරක්‍ෂාව ද වැඩි දියුණු කරනු ලබයි. මෙය රාජ්‍ය අංශය තුළ මධ්‍යගත පාලනය, අනුකූලතාවය සහ අනාගත ඩිජිටල් පරිවර්තන මුලපිරීම් සඳහා ද සහාය වනු ඇත.

❖ ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC) හා සම්බන්ධ වීම

ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ මූලික අරමුණ වන්නේ තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් සහිත සංවිධාන සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා පුළුල් සයිබර් ආරක්ෂණ පරීක්ෂාව, අධීක්ෂණය සහ සයිබර් සිද්ධි සම්බන්ධයෙන් ක්ෂණික ප්‍රතිචාරක සේවා සැපයීමයි. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) විසින් පවත්වන ලද ජාතික සමීක්ෂණයකින් පසුව, තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023 මැයි 02 දින නිකුත් කළ MOT/2023/01 චක්‍රලේඛය පරිදි, මුදල් අමාත්‍යාංශය තීරණාත්මක තොරතුරු පද්ධති සහිත ආයතනයක් ලෙස හඳුනාගෙන ඇත.

❖ Structural Asset Module of the Non-Financial Asset Management System (NFAMS)

2026 සඳහා රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ITMIS පද්ධතියේ අදාල මොඩියුලයන් ක්‍රියාත්මක කරන තෙක් අදාල දෙපාර්තමේන්තු සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තු සහාය සේවා ආරම්භ කර ඇති අතර, දැනට UAT ක්‍රියාවලියට භාජනය වෙමින් පවතින මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි (NFAMS) Structure මොඩියුලය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඊට අමතරව ඉතිරි NFAMS මොඩියුල වන Buildings, Plant & Machinery, and Office Equipment මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

❖ Internal Audit Management System – DMA Connect

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සඳහා සංවර්ධනය කර DMA Connect ලෙස නැවත නම් කරන ලද Xpert Audit පද්ධතිය 2026 දී නිම කිරීමට සැලසුම් කර ඇත. පද්ධතියේ පළමු අදියර වන විගණන සැලැස්ම නිර්මාණය කිරීමේ මොඩියුලය දැනටමත් සංවර්ධනය කර ඇති අතර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වෙනස්කම් ඉල්ලීම් මත පදනම්ව, ඊළඟ අදියරයන් සමඟ ඉදිරියට යාමට පෙර මෙම අදියර සඳහා වැඩිදියුණු කිරීම් දැනට සිදුවෙමින් පවතී.

❖ Microsoft 365 ස්ථාපිත කිරීම

මුදල් අමාත්‍යාංශය විසින් දැනට අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපිත Microsoft Exchange විද්‍යුත් තැපැල් පද්ධතිය, Microsoft Office කාර්යාල ඵලදායිතා මෙවලම් සහ Active Directory, ඒකාබද්ධ පරිශීලක ගිණුම් Microsoft 365 වෙත සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

මීට සමාන්තරව, දැනට අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපිත File Share පද්ධතිය Microsoft SharePoint Online සහ OneDrive වෙත සංක්‍රමණය කරනු ලබන අතර, එමඟින් ලේඛන කළමනාකරණය මධ්‍යගත, ආරක්ෂිත සහ පාලිත අයුරින් පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

මෙම මුලපිරීම මඟින් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ හැකියාවන් සැලකිය යුතු ලෙස ශක්තිමත් කරනු ඇත:

- Cloud තාක්ෂණය මත පදනම් වූ අනන්‍යතා කළමනාකරණය, බහු-සාධක සත්‍යාපනය (multifactor authentication) සහ ගොඩනඟන ලද (built-in) දත්ත ආරක්ෂණ ක්‍රම හරහා ආරක්ෂාව වැඩි දියුණු කිරීම.
- Microsoft Teams, SharePoint සහ Cloud-enabled Office යෙදුම් වැනි නවීන මෙවලම් හරහා සහයෝගීතාවය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම
- අමාත්‍යාංශ පරිශ්‍රයේ පැරණි යටිතල පහසුකම් මත යැපීම අඩු කිරීම සහ මෙහෙයුම් සහ නඩත්තු වියදම් අවම කිරීම
- ව්‍යාපාර අඛණ්ඩතාව සහ පරිමාණය කළ හැකි බව (scalability) සහතික කරමින් දෙමුහුන් සහ දුරස්ථ වැඩ (remote work) ආකෘති සඳහා සහාය වීම
- රජයේ තොරතුරු තාක්ෂණ නවීකරණ අරමුණු සමඟ සමපාත වන අනාගතය සඳහා සූදානම්, අනුකූල වන (compliant) සහ ඔරොත්තුදීමේ හැකියාව ඇති (resilient) ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම

Microsoft 365 ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ ඩිජිටල් පරිවර්තන ගමන් මාර්ගයේ සන්ධිස්ථානයක් නියෝජනය කරන අතර අනාගත තොරතුරු තාක්ෂණ මුලපිරීම් සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

එම් එම් සී පී මොහොට්ටිගෙදර

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

03 පරිච්ඡේදය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		**-**	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		185,181,000	1,134,871,000	ඒසීඒ-3
-	තැන්පතු		1,426,848	1,879,126	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,577,946	3,626,998	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			2,515,420	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**191,185,794**	**1,142,892,544**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**191,185,794**	**1,142,892,544**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		41,227	546,202	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**191,144,567**	**1,142,346,342**	

අඩු කළා : වියදම්

-	**පුනරාවර්තන වියදම්**		-	-	
72,420,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	68,614,998	53,226,906	
309,470,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	112,308,190	1,073,880,237	ඒසීඒ-2(ii)
480,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	429,516	460,016	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
382,370,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**181,352,704**	**1,127,567,159**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	4,478,519	
190,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,491,543	4,035,017	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,500,000	හැකියා වර්ධනය	14	1,379,500	817,950	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
192,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**5,871,043**	**9,331,486**	
	තැන්පතු ගෙවීම්		2,181,714	1,328,981	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,193,260	4,324,016	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**8,374,974**	**5,652,997**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**195,598,721**	**1,142,551,642**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(4,454,154)	(205,301)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,454,154)	(205,301)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	61,053,508	55,476,826
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	8,858,129	7,242,815
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**69,911,637**	**62,719,641**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,658,129	6,287,949
දේපළ පිරියත හා උපකරණ සංචිතය		61,053,508	55,476,826
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	200,000	954,866
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**69,911,637**	**62,719,641**

පිටු අංක...07...සිට ...21... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...22... සිට ...27... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 24/02/2026
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 20/02/2026
විමල් එස්.කේ. ලියනගම 2
අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.)
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ - 01.

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 19/02/2026
ඩී. පී. ඥානේන්ද්‍ර ප්‍රදීප්
අධ්‍යක්ෂ (මුදල්)
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	සංශෝධිත
	2,025 රු.	**2,024** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	4,303,656	2,515,420
අග්‍රිම ලැබීම්	185,181,000	1,134,871,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,148,137	3,928,680
තැන්පතු ලැබීම්	1,426,848	1,879,126
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**196,059,641**	**1,143,194,226**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	180,778,763	1,126,941,494
සහනාධාර සහ මාරුකිරීම්	429,516	460,016
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	-	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	564,118	262,031
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	41,227	546,202
අත්තිකාරම් ගෙවීම්	6,193,260	4,324,016
තැන්පතු ගෙවීම්	2,181,714	1,328,981
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**190,188,598**	**1,133,862,740**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**5,871,043**	**9,331,486**

<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	5,871,043	9,331,486
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**5,871,043**	**9,331,486**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(5,871,043)**	**(9,331,486)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**(0)**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) **<u>පිළියෙල කිරීමේ අරමුණ</u>**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **<u>මිනුම්කරණ පදනම</u>**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **<u>ආදායම් හඳුනාගැනීම</u>**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		______ අදාල නොවේ ______			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම *	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	382,370,000	382,370,000	181,352,704	47.43
ප්‍රාග්ධන	192,000,000	192,000,000	5,871,043	3.06

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		______ අදාල නොවේ ______				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-		
9152	යන්ත්‍රෝපකරණ	58,387	58,387	-	100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්	2,667	2,667	-	100
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ 2025 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

04 පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75%-89%**	**50%-74%**
1	මුදල් අමාත්‍යාංශයේ පරිශ්‍රය තුළ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම, නඩත්තු කිරීම හා අධීක්ෂණය කිරීම	100%		
2	මුදල් අමාත්‍යාංශයේ දෘඪාංග නඩත්තුව	100%		
3	e-Payroll පද්ධතිය	100%		
4	MoF වෙබ් ද්වාරයේ අන්තර්ගත යාවත්කාලීන කිරීම	100%		
5	භාණ්ඩාගාර අන්ත : ජාලය අධීක්ෂණය සහ නඩත්තු කිරීම	100%		
6	කාර්යක්ෂම නිල සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල් පද්ධතිය (Outlook) සම්බන්ධීකරණය කිරීම	100%		
7	පද්ධති සංවර්ධනය/පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම	100%		
8	පුහුණුවන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම/කළමනාකරණය කිරීම	100%		

05 පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
08. සියල්ල ඇතුලත් සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායි රැකියා නියුක්තිය සහ සැමට මනා කාර්යභාරයක් ප්‍රවර්ධනය කිරිම	නවීන ක්‍රමවේද තොරතුරු තාක්ෂණ සන්නිවේදන භාවිතා කරමින් එක් එක් දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රිය පද්ධති සහ කාර්ය පටිපාටින් ක්‍රියාත්මක කිරිම සහතික කිරීම	පද්ධති සංවර්ධනය කිරිම			100%
		අභ්‍යන්තර ලේඛණ කළමනාකරණ පද්ධතිය ප්‍රවර්ධනය			100%
	භාණ්ඩාගාරයේ ආර්ථික, මූල්‍ය, ආයතනික යනාදී තොරතුරු පහසුවෙන් රාජ්‍ය ආයතනවලට හා පොදු මහජනතාවට ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම	මහා භාණ්ඩාගාර වෙබ් අඩවිය යාවත්කාලින කිරීම			100%
09. නවමු යටිතල පහසුකම් ගොඩනැංවීම, සියල්ල ඇතුළත් තිරසාර කාර්මිකරණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම	ඉ-රාජ්‍ය අරමුණු සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණික ක්‍රියාවන් සම්බන්ධීකරණය	තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තුව			100%
		තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවල කටයුතු ඩිජිටල්කරණය කිරීමේ වගකීම තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, ඉහත 5.1 හි හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා 2025 වර්ෂයේදී පහත දැක්වෙන කටයුතු සාර්ථකව සිදු කරන ලදී.

- අමාත්‍යාංශයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් ආරක්ෂිත හා බාධා රහිත සන්නිවේදන පරිසරයක් ගොඩ නගා ඇති අතර, උසස් තත්ත්වයේ, ඵලදායී හා කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් සඳහා ශක්තිමත් පදනමක් සපයන ලදී
- උපස්ථ කිරීම (backup), අනුකෘති කිරීම (replication), ගිණි පවුර (firewall) සහ Endpoint Security වැනි විසඳුම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමත්, භෞතික ආරක්ෂක පියවරයන් ගැනීමත් මගින් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ආරක්ෂාව හා ස්ථිර පැවැත්ම වැඩිදියුණු කරන ලදී
- වසර පුරා සිදුවූ සයිබර් තර්ජන හා සයිබර් ප්‍රහාර වලක්වාලීම සඳහා ක්ෂණික, තීරණාත්මක හා සුදුසු ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කිරීමෙන් ඒවා සාර්ථකව වළක්වාලන ලදී.
- භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු සඳහා තොරතුරු තාක්ෂණ සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී
- භාණ්ඩාගාරය යටතේ ඇති සියලු දෙපාර්තමේන්තු සඳහා මධ්‍යගත විදේශ නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Overseas Leave Management System – OLMS) සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙම පද්ධතිය මඟින් විදේශ නිවාඩු අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ සිට අවසන් අනුමැතිය දක්වා වූ ක්‍රියාවලිය සරල කරමින්, අයදුම්පත් තත්ත්වය ක්ෂණිකව නිරීක්ෂණය කිරීම, විනිවිදභාවය වර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති අනුකූලතාවය මෙන්ම ස්වයංක්‍රීය වැඩ ප්‍රවාහයක් මගින් නිවාඩු අනුමැතිය සඳහා වන ප්‍රමාදයන් සැලකිය යුතු ලෙස අඩු කිරීමට හැකිවිය
- DMA Connect හි පළමු අදියර (පෙර Xpert Audit ලෙස හැඳින්වූ) සාර්ථකව සම්පූර්ණ කර, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) සඳහා ලබා දෙන ලදී. මෙම මොඩියුලය කාර්යක්‍ෂමතාව, විනිවිදභාවය සහ අන්තර් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය වැඩිදියුණු කරමින් ව්‍යුහගත සහ ප්‍රමිතිගත කාර්ය ප්‍රවාහයක් හරහා ඔවුන්ගේ විගණන සැලසුම් ඩිජිටල් ලෙස සකස් කිරීමට, කළමනාකරණය කිරීමට සහ ඉදිරිපත් කිරීමට රජයේ දෙපාර්තමේන්තුවලට බලය ලබාදේ

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී, දෙපාර්තමේන්තුව මුහුණ දුන් අභියෝග;

- ස්ථාන මාරුවීම්, සේවා උසස් වීම් මත විෂයානුබද්ධ පුහුණු, කුසලතා සහිත අත්‍යාවශ්‍ය නිලධාරීන්ගේ දැඩි හිඟයක් පැවතීම
- තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සහ ඒ ආශ්‍රිත උපාංගවල පිරිවැය ඉහළ යෑම, දියුණු තාක්‍ෂණික හා ඇතැම් තීරණාත්මක මුලපිරීම් සඳහා සැලසුම් කළ කාලරාමුවලට අනුකූලව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපා ඇත
- මුහුණ පෑමට සිදු වූ සයිබර් ප්‍රහාර සියල්ලක්ම බාහිර පාර්ශ්වයන්ගේ සහාය ඇතිව සාර්ථකව කළමනාකරණය කර වළක්වා ඇත

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 2025.12.31 දිනට සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	17	13	04
තෘතීයික	16	11	05
ද්විතියික	36	25	11
ප්‍රාථමික	09	07	02
වෙනත්	02	00	02
එකතුව	**80**	**56**	**24**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑනු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මුදල් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වෙත දෛනික තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීමට අමතරව, ජාල පරිපාලනය, සයිබර් ආරක්ෂණය සහ පද්ධති සංවර්ධනය වැනි කාර්යයන් ඉටු කරනු ලබයි. එම දෛනික කාර්යභාරයන් මෙන්ම "මුදල් අමාත්‍යාංශය ඩිජිටල්කරණය" වැඩපිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සියලුම සේවා කාණ්ඩ වලට අයත් නිලධාරීන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය වේ.

එසේම, මුදල් අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු කිහිපයක් සඳහා සංවර්ධනය කර ඇති හා සංවර්ධනය කරමින් පවතින තොරතුරු කළමනාකරණ පද්ධති නිසි පරිදි ක්‍රියාත්මක වීමත්, සැලසුම් කළ කාලසීමාවන් තුළ ඒවා අවසන් කිරීමත් ජාතික වශයෙන් වැදගත් වේ. මෙම තොරතුරු කළමනාකරණ පද්ධති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සිදු කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් ද විශේෂ වැදගත්කමක් දරයි.

තවද මෙම දෙපාර්තමේන්තුවේ පවතින දැඩි කාර්ය මණ්ඩල පුරප්පාඩු යටතේ වුවද, පවත්නා සීමිත කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගනිමින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරමින් පවතී.

මීට විසඳුමක් ලෙස, ප්‍රායෝගික පුහුණුව සඳහා උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලින් බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන්ගේ ද සහාය ඇතිව කාර්යක්ෂම සේවාවක් සැපයීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහන් කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	ග්‍රැෆික් නිර්මාණය	01	මාස 03	22,500	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
02	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය	01	දින 02	13,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
03	පරිගණක දෘඩාංග	01	මාස 03	17,500	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
04	තොරතුරු ආරක්ෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	01	අවුරුදු 02	615,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
05	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම	01	දින 01	6500	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
06	රජයේ වැටුප් ක්‍රමය	01	දින 03	18,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
07	රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි	01	දින 02	13,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
08	භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන පද්ධතිය සඳහා නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වා දීම	01	දින 02	13,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
09	ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි	01	දින 02	13,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
10	රජයේ මුදල් රෙගුලාසි	01	දින 01	7000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
11	කෘත්‍රිම බුද්ධිය (AI) තාක්ෂණ වැඩමුළුව	11	දින 01	-	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
12	ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව	19	දින 02	256,500	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
13	ව්‍යාපෘති කළමනාකරණ ජාතික සමුළුව -2025	02	දින 01	30,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
14	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ වැඩමුළුව	01	දින 01	7500	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
15	රජයේ වැටුප් ක්‍රමය ප්‍රගුණ කිරීම	01	දින 02	15,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
16	විනය හා කාර්යාලීය ආචාර විධි	02	දින 02	26,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
17	ඩිජිටල් පරිවර්තනය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුව	02	දින 04	-	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
18	වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව	03	අවුරුදු 01	276,000	-	දේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
19	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	02	දින 02	30,000	-	දේශිය	විෂය දැනුම වර්ධනයකර ගැනිම

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහන් කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
20	ගෝලීය ආරක්ෂක මුලපිරීම යටතේ සයිබර් ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය (චීනය)	01	දින 14	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
21	Government Cloud Based Big Data කළමනාකරණය සහ යෙදුම පිළිබඳ සම්මන්ත්‍රණය (චීනය)	01	දින 14	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
22	JICA දැනුම සහයෝගීතා නිර්මාණ වැඩසටහන (ජපානය)	01	මාස 04	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
23	තීරයක් සහ මාර්ගයක් සහිත (Belt and Road) රටවල් සඳහා තොරතුරු ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය (චීනය)	01	දින 17	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
24	ක්ෂුද්‍ර ව්‍යාපාර වර්ධනය සඳහා ඩිජිටල් යුගය පුහුණු වැඩසටහනේ ව්‍යවසායකත්වය (ITEC)	01	දින 14	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
25	ආසියානුවන් සඳහා ඩිජිටල් ආර්ථික ප්‍රමිතිකරණය පිළිබඳ සම්මන්ත්‍රණය (චීනය)	02	දින 14	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම
26	ඉන්දියා ස්ටැක් අවබෝධතා ගිවිසුම යටතේ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සඳහා විශේෂිත වැඩසටහන (ITEC)	01	දින 14	-	-	විදේශිය	විෂය දැනුම වර්ධනය කර ගැනිම

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අදාළ නැත		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නැත		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අදාළ නැත		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නැත		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම (2023.11.30 දිනැති 02/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධනය කර ඇත.)	අදාල නැත		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	TPD/E/DITM/FS/25/40	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුව, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු

ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2025 දෙසැම්බර් මාසයට අදාළව පිරිසිදු කිරීමේ සේවාව වෙනුවෙන් 2026 වර්ෂයේදී ගෙවන ලද රු.68,003 ක වියදමක් 2025 වර්ෂයට අදාළ බැරකමක් ලෙස බැරකම් ප්‍රකාශයේ හඳුනාගෙන නොතිබුණි.

3.2 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර, ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයේ ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

යොමුව	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
(අ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි,	
(i) 3.7 ඡේදය	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අගයන් ආසන්න රුපියලට වාර්තා කළ යුතු වුවද, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි ත්‍රෛභාෂාවෙහිම 2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය හා 2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශනයෙහි, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii) 4.2 ඡේදය	සියලුම ආකෘතිපත්‍ර සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරී හෝ ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) විසින් අත්සන් යෙදිය යුතු වුවද, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි ත්‍රෛභාෂාවෙහිම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.4 අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) මු.රෙ. 371(5) ප්‍රකාරව, දින 10 ක් තුළ අතුරු අග්‍රිම පියවිය යුතු වුවද, 2025 වර්ෂය තුළ නිලධාරීන් දෙදෙනෙකු සඳහා ලබා දී තිබූ එකතු වටිනාකම් රු.22,000 ක අත්තිකාරම් පියවීම සඳහා දින 09 සිට මාසයක් දක්වා ප්‍රමාද වී තිබුණි.

(ආ) අපේක්ෂිත වියදම නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් නිලධාරීන් වෙත ලබා දුන් මුළු අත්තිකාරම් එකතු වටිනාකම වූ රු.34,000 කින් රු.22,695 ක් නැවත මුදලින් පියවා තිබූ අතර, එය සියයට 50 ත් 86 ත් අතර පරාසයකින් යුක්ත විය. එසේම, දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ලේඛනයේ අත්තිකාරම් ලබා දුන් නිලධාරියාගේ තනතුර සඳහන් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වූ පද්ධති සංවර්ධන වැඩසටහන් 03 න් 01 ක් පමණක් වර්ෂය තුළ අවසන් කර තිබූ අතර, වර්ෂය තුළ නිම කිරීමට තිබූ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය නියමිත කාල රාමුව තුළ නිම කිරීමට නොහැකි වීමෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් කාලය දීර්ඝ කිරීම් ඉල්ලා තිබුණි. තවද, මෙම පද්ධතිය කාලීනව නිම කිරීම සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුමක් සහිත අමතර නිලධාරීන් 50 ක් හා රු.63,397,515 ක් වැය වන බව දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසු පුරෝකථනය කර තිබුණි. එබැවින්, මෙම දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමට අනුයුක්ත කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම බලපා ඇති බව නිරීක්ෂණය විය.

4.1.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2025 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු පිරිවැය රු.357,970,000 ක් වූ ප්‍රසම්පාදනයන් 18 ක් සැලසුම් කර තිබූ අතර, ඉන් රු.181,020,000ක ඇස්තමේන්තු වටිනාකමින් යුත් ප්‍රසම්පාදනයන් 6 ක් 2026 මාර්තු 19 වන විටත් නිම කර නොතිබුණු අතර, එය මුළු ප්‍රසම්පාදන ඇස්තමේන්තු වටිනාකමින් සියයට 51 ක ප්‍රතිශතයක් විය.

(ආ) Manageable Switchers 02ක් මිලදී ගැනීම සඳහා 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළ රු.60,000,000 ක ඇස්තමේන්තු පිරිවැයකට සැලසුම් කර තිබූ අතර, අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු වෙත රු.8,025,600කට ලංසු ප්‍රදානය කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර, 2025 ඔක්තෝබර් 01 දින කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය ලංසුකරු වෙත යොමු කළ ද, සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ නොතිබුණි. කෙසේවුවද, අදාළ කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව 2026 මාර්තු 06 දින වන විට Network Switches සවි කර තිබුණි.

(ඇ) 2025 වර්ෂය තුළදී රු.1,000,000 ක ඇස්තමේන්තු වටිනාකමක් වූ High – End Computer ප්‍රසම්පාදනය සඳහා e-Gp පද්ධතිය හරහා ලංසුකරුවන් තිදෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව තාක්ෂණික හා මූල්‍ය අවශ්‍යතා සම්පූර්ණ නොවන බැවින් නැවත මිල ගණන් කැඳවා තිබූ අතර, ලංසුකරුවන් තිදෙනෙකු ලංසු ඉදිරිපත් කර තිබුණි. එම දෙවන වරට ලැබූ ලංසු ඇගයීමෙන් පසු රු.876,900 කට පෞද්ගලික ආයතනයක් වෙත ලංසු ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ එකඟතාවය රහිතව තීරණය කර තිබූ අතර, 2026

මාර්තු 31 දින වන විට මාස 03 ක් ගත වී තිබුණ ද, ප්‍රසම්පාදනය සිදු නොවීම මත අදාළ ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වී නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ඉන්වෙන්ට්‍රි ලේඛනයේ හා සිගාස් පද්ධතියේ ශේෂය සැසඳීමේදී 2025 දෙසැම්බර් 31 දිනට සිගාස් පද්ධතියේ මූල්‍ය නොවන වත්කම් අයිතම 04 ක ඇතුළත් ඒකක 10 ක වටිනාකම රු.1,192,563 කින් අධි ගණනය වී තිබීමෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ශේෂය එම වටිනාකමෙන් අධි ගණනය වී තිබුණි.

(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර තිබූ නමුත් සිගාස් පද්ධතියේ අඩුවෙන් ඇතුළත් කර තිබූ විදුලි පංකා 04 ක් සහ External Hard Disk 10 ක් නිරීක්ෂණය වුණි. ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ වත්කම්වල වටිනාකම සඳහන් නොවන බැවින් විගණනයේදී එම වටිනාකම ගණනය කළ නොහැකි විය.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රියෙහි ඇතුළත් මූල්‍ය නොවන වත්කම්වල අයිතම 23ක ඇතුළත් ඒකක 218ක වටිනාකම හඳුනාගෙන නොමැති වීමෙන් සිගාස් පද්ධතියට ඇතුළත් කර නොතිබුණු අතර, මේ හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් වැඩිවීමේ වටිනාකම විගණනයේදී ගණනය කළ නොහැකි වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දැක්වුණි.

(ඈ) සිගාස් පද්ධතියේ ඇතුළත් වූ රු.35,948 ක වටිනාකමකින් යුතු අයිතමයන් 07 කට අදාළ ඒකක 08 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර, 2026 මැයි 11 දින ගණකාධිකාරීගේ උපදෙස් හා අනුමැතිය මත සිගාස් පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, රු.12,154 ක අයිතමයක් ඉන්වෙන්ට්‍රි ලේඛ නයට ඇතුළත් කිරීමට හෝ සිගාස් පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් රු. 48,102 කින් 2025 දෙසැම්බර් 31 දිනට සිගාස් පද්ධතියේ ශේෂය වැඩියෙන් දැක්වීමෙන් මූල්‍ය නොවන වත්කම් ශේෂය එම වටිනාකමෙන් අධිගණනය වී තිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 (i) ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරය වන රජයේ ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, 2026 පෙබරවාරි 28 දින වන විටත් නිලධාරීන් 05 දෙනෙකු විසින් එසේ ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	17	13	04
තෘතියික මට්ටම	16	10	06
ද්විතියික මට්ටම	36	25	11
ප්‍රාථමික මට්ටම	09	07	02
වෙනත්	02	00	02
	80	**55**	**25**

2025 දෙසැම්බර් 31 දින වන විට අනුමත කර තිබූ කාර්යය මණ්ඩලය 80ක් වූ අතර, ඉන් නිලධාරින් 25ක් හෙවත් අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 31 ක් පුරප්පාඩු වී පැවතුණි. තවද, අනුමත සේවක සංඛ්‍යාව තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 04 ක් ද, තෘතියික මට්ටමින් නිලධාරින් 06 ක් සහ ද්විතියික මට්ටමින් නිලධාරින් 11ක් පුරප්පාඩු වීමෙන් දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය ඉටු කිරීමට කාර්යය මණ්ඩලයට අපහසු වීමත්, කඩිනමින් සපුරාලිය යුතු පද්ධති සංවර්ධන අවශ්‍යතාවයන් ඉටු කිරීමට නොහැකි වීමෙන් අදාළ ආයතනයන් හට නෛතික අවශ්‍යතාවයන්ට හා නියමිත කාල රාමුවට එම පද්ධතිය භාවිතයට යොදා ගත නොහැකි වීමත්, තෙවන පාර්ශවයක් වෙත යොමු කිරීමෙන් අතිරේක පිරිවැයක් රජයට දැරීමට සිදු වීමත් හා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ අරමුණ ඵලදායි අයුරින් ඉටු කර ගැනීමට නොහැකි වීමත් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට